ET/SSS/2022(2023)/OL/87/S/A/S-4

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Communication and Media Studies

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය




## Answer Sheet - I, II | පිළිතුරු පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)

Nenasa

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

# ලකුණු දීමේ පටිපාටිය

## පත්‍රය I - පිළිතුරු

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | 4 | 11 | 4 | 21 | 4 | 31 | 3 |
| 02 | 4 | 12 | 2 | 22 | 4 | 32 | 1 |
| 03 | 1 | 13 | 4 | 23 | 3 | 33 | 4 |
| 04 | 4 | 14 | 3 | 24 | 3 | 34 | 1 |
| 05 | 3 | 15 | 3 | 25 | 4 | 35 | 2 |
| 06 | 3 | 16 | 2 | 26 | 1 | 36 | 4 |
| 07 | 2 | 17 | 3 | 27 | 1 | 37 | 3 |
| 08 | 2 | 18 | 3 | 28 | 2 | 38 | 2 |
| 09 | 3 | 19 | 4 | 29 | 1 | 39 | 2 |
| 10 | 1 | 20 | 2 | 30 | 3 | 40 | 4 |

විශේෂ උපදෙස් - එක් පිළිතුරකට ලකුණු 01 බැගින්

මුළු ලකුණු 1 X 40 = 40

*****

## පත්‍රය II - පිළිතුරු

| | | |
|---|---|---|
| 1 වන අනිවාර්ය ප්‍රශ්නයට ලකුණු 02 බැගින් 10 | - | 20 |
| 2 වන - 7 වන ප්‍රශ්න සඳහා තෝරාගත් ප්‍රශ්න 04කට ලකුණු 10 බැගින් | - | 40 |
| | | 60 |

### කොටස් ලකුණු බෙදීම

2 - 6 දක්වා සෑම ප්‍රශ්නයක් සඳහා

| | | | |
|---|---|---|---|
| I. | කොටසට | - | ලකුණු 1 |
| II. | කොටසට | - | ලකුණු 2 |
| III. | කොටසට | - | ලකුණු 3 |
| IV. | කොටසට | - | ලකුණු 4 |
| | | | 10 |

01.

(i) තොරතුරු සම්පාදන කාර්යය
දැනුවත් කිරීමේ කාර්යය
පෙළඹවීමේ කාර්යය
සමාජානුයෝජන කාර්යය
සංස්කෘතික ප්‍රගමනය
ඒකාබද්ධතාව

(ii) ස්වාධීන රූපවාහිනී සේවය - 1979

(iii) වර්ගය - ජන සන්නිවේදනය
ස්වරූපය - ශ්‍රව්‍ය දෘශ්‍ය

(iv) පුවත් ඉව, තොරතුරු මූලාශ්‍රය පිළිබඳ දැනුවත් බව, ඉවසීම, හොඳ නිරීක්ෂකයෙකු වීම, ආචාරශීලී බව, සුහද බව, කාල කළමනාකරණය, විචක්ෂණ බව, අපක්ෂපාතී බව, ස්ථිරසාරතාව, උපායශීලී බව

(v) ප්‍රවෘත්ති
වාර්තා වැඩසටහන්
ටෙලි නාට්‍යය
සංගීත වැඩසටහන්
සාකච්ඡා හා සංවාද වැඩසටහන්
සඟරාමය වැඩසටහන්
යථාකාරී වැඩසටහන්
සජීවී වැඩසටහන්

**(vi)**

| **(vii)** **යහපත්** | **අයහපත්** |
|---|---|
| තොරතුරු ලබා දීම | ළමා පරපුරට විෂම චර්යා ඇති කිරීම |
| දැනුවත්භාවය ලබා දීම | දේශීය සංස්කෘතියට බලපෑම් කිරීම |
| සමාජානුයෝජනය කිරීම | රූප මාධ්‍ය ප්‍රචණ්ඩත්වය |
| සංස්කෘතික හුවමාරුව | වෙළෙඳ ප්‍රචාරණයේ අහිසි බලපෑම |

(viii) ප්‍රතිසම තාක්ෂණයෙන් (Analog) අංකිත තාක්ෂණයට (Digital) පරිවර්තනය වීම
චන්ද්‍රිකා ත්ක්ෂණය මගින් රූපවාහිනී විකාශනය සිදු වීම
රූපවාහිනිය ඔස්සේ ත්‍රිමාණ ආකාරයේ දර්ශන ලබා ගැනීමේ හැකියාව
ප්‍රමාණයෙන් කුඩා වීම
බිත්තියේ රැඳවීමට හැකිවීම
පැහැදිලි පින්තූර ලබා ගත හැකි වීම (HD TV)
විවිධ හැඩයේ වැඩසටහන් ආකෘති හඳුන්වා දීම

(ix) දෘෂ්ටියේ අඛණ්ඩතාව

(x) මැජික් ලන්තැරුම

(xi) නිහඬ සිනමා යුගය
චාලි චැප්ලින්

02.

(i) සමූහ සන්නිවේදනය

(ii) සන්නිවේදකයා එක් අයෙක් වන අතර, ග්‍රාහකයන් සමූහයක් සිටීම
සමූහය කුඩා හෝ විශාල විය හැකි අතර ඔවුන් විවිධ වන්නට පුළුවන
සමූහයේ සිටින සියල්ලන්ට පොදු භාෂාවක් හා මාධ්‍ය භාවිත කළ යුතු වීම
ආකර්ෂණීය ලෙස සන්නිවේදන කාර්යයේ යෙදීම
නිර්වාචික සන්නිවේදන උපක්‍රම භාවිතය
අවශ්‍ය පරිදි තාක්ෂණික මෙවලම් භාවිතය
බොහෝදුරට ඒක පාර්ශවීය සන්නිවේදන ක්‍රියාවලියක් වීම

(iii) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය
කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය
ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය
බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය
අන්තර් ක්‍රියාකාරී පුවරුව

(iv) WhatsApp, Viber, Telegram, e mail, blog

**3.**

(i) මධ්‍යම තරංග (MW)
කෙටි තරංග (SW)
සංඛ්‍යාත මූර්ජන තරංග (FM)

(ii) ජන මාධ්‍යයකි
ප්‍රබල සන්නිවේදන මාධ්‍යයකි
ශ්‍රවණ මාධ්‍යයකි
හඬ පාදක කරගත් මාධ්‍යයකි
සුහදශීලී මාධ්‍යයකි
කථනය මූලික කරගත් මාධ්‍යයකි
ජංගමශීලී මාධ්‍යයකි
පුද්ගල කේන්ද්‍රීය මාධ්‍යයකි
ශ්‍රැති ගෝචර මාධ්‍යයකි
පරිකල්පනීය මාධ්‍යයකි

(iii) හූව
සණ්ටාර හඬ
බෙර හඬ
සත්ත්ව නාද
ස්වභාවික ශබ්ද
සක් හඬ

(iv)

| **ප්‍රබලතා** | **දුබලතා** |
|---|---|
| අතිශය ක්ෂණික මාධ්‍යයකි<br>එසැනින් අසන්නන්ට යොමු වේ<br>ශ්‍රාවකයාට පහසුවෙන් සම්බන්ධ විය හැකිය<br>භූගෝලීය බාධක විරලය<br>අඩු වියදම් මාධ්‍යයකි<br>පහසුවෙන් හැසිරවිය හැකි මාධ්‍යයකි | හුදෙක් ශබ්දය පාදක වූ මාධ්‍යයකි<br>කනට ඇසෙන්නේ එක් වරක් පමණි<br>අසන්නාගේ අවධානය ගුවන්විදුලි වැඩසටහනින් ඉවතට යොමු වීමට ඇති ඉඩකඩ වැඩිය<br>ගැඹුරු සංකීර්ණ අදහස් ග්‍රාහකගත කිරීමේ අපහසුතාව |

4.

(i) නැවුම් බව හා සුවිශේෂී බව සහිත ප්‍රයෝජනවත්, අර්ථ සම්පන්න අදහසක් ඔස්සේ බිහිවන දෙයකි.

(ii) ආර්ථික අයිතිවාසිකම් - කිසියම් නිර්මාණයක හිමිකරුවාට/ කර්තෘට සිය නිර්මාණයේ ආර්ථික ප්‍රතිලාභ ලැබීමට ඇති අයිතිය යි.

සදාචාර අයිතිවාසිකම් - කිසියම් නිර්මාණයක අනන්‍යතාව පිළිබඳ පවතින අයිතිය යි.

(iii) මාධ්‍ය ආයතනයේ හිමිකාරිත්වය

මාධ්‍ය හා සම්බන්ධ ආර්ථික හා සමාජ සාධක

අදාළ කාලයේ පවතින දේශපාලන වාතාවරණය

සංස්කෘතික පසුබිම

(iv) ප්‍රචණ්ඩකාරී දර්ශන ඇතුළත් කාටූන්

අපරාධ, සාහසික ක්‍රියා හා ගැටුම් අවස්ථා පිළිබඳ ප්‍රවෘත්ති

ප්‍රචණ්ඩ සිදුවීම් වාර්තා කරන වීඩියෝ දර්ශන හා ඡායාරූප

ගැටුම් නිරූපණය කරන ටෙලි නාට්‍ය

ප්‍රචණ්ඩත්වයෙන් යුතු ක්‍රීඩා වැඩසටහන්

ඇතැම් චිත්‍රපට

ඇතැම් පරිගණක ක්‍රීඩා

**5.**

(i) මාධ්‍ය අභිසාරිතාව

(ii) විද්‍යුත් මාධ්‍ය - විද්‍යුත් තාක්ෂණය පදනම් කරගෙන සංඥා, සංකේත පද්ධතියක් මඟින් සන්දේශ සම්ප්‍රේෂණය කිරීමේ ක්‍රියාවලියක් හරහා තොරතුරු බෙදා හරින ජන මාධ්‍ය වේ.

උදා- ගුවන්විදුලිය, රූපවාහිනිය

මුද්‍රිත මාධ්‍ය - ලිඛිත සන්නිවේදන ස්වරූපය මත පදනම්ව මුද්‍රණය කර විශාල පිරිසක් වෙත සවිස්තරාත්මකව තොරතුරු ගෙන ඒමේ ක්‍රමය මුද්‍රිත මාධ්‍ය වේ.

උදා - පුවත්පත්, සඟරා, පොත්

(iii) e mail, WhatsApp, Telegrame,

(iv) ක්ෂණිකව පුවත් දැන ගැනීමේ හැකියාව

ගබඩා කර තබා ගැනීමේ පහසුව

නැවත නැවත කියවිය හැකි වීම

තොරතුරු විෂයන් අනුව වර්ග කරමින් පළ කොට තිබීම

යාවත්කාලීන කිරීමේ පහසුකම් වැඩි වීම

ක්ෂණික පාඨක ප්‍රතිචාර ලැබීම.

6.

(i) ස්වරූප - වාචික සන්නිවේදනය, ශ්‍රව්‍ය සන්නිවේදනය

වර්ග - අන්තර්පුද්ගල සන්නිවේදනය

(ii) සන්නිවේදකයාට හා ග්‍රාහකයාට සමීපව සන්නිවේදනයේ යෙදිය හැකි වීම

පුද්ගලයන් දෙදෙනෙකු හෝ කිහිප දෙනෙකු සහභාගී වීම

ඍජු ප්‍රතිචාර හා ප්‍රතිපෝෂණ ලබා ගත හැකි වීම

නිර්වාචික සන්නිවේදනය ප්‍රබලව යොදාගත හැකි වීම

සන්නිවේදන බාධක අවම වීම

තාක්ෂණික උපකරණ භාවිතයෙන් දුරස්ථව සිට වුව ද සන්නිවේදනයේ යෙදිය හැකි වීම

(iii) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය

**විශේෂතා**

සිතිවිලි හා හැඟීම් මත සන්නිවේදනය සිදු වීම

තම දැක්මට අනුව සංකල්පය ක්‍රියාත්මක වීම

ආත්ම භාෂණයට ප්‍රමුඛත්වය ලැබීම

තමා තුළ පවතින මතකය අනුව සන්නිවේදනය සිදුවීම

තමාගේ අර්ථකථනයට අනුව සන්නිවේදනයේ යෙදීම

පුද්ගල තීරණ ගැනීමේ කාර්යය සිදුවීම

(iv) වෛද්‍යවරයකු හමු වීම

බසයේ කොන්දොස්තර සමග කතා කිරීම

කොන්දොස්තර මගියකු සමග කතා කිරීම

සම්මුඛ පරීක්ෂණයකට සහභාගි වීම

බැංකු කවුළුවක දී බැංකු නිලධාරියකු සමග කතා කිරීම

පොලිසියට ගොස් පැමිණිල්ලක් කිරීම

පාවහන් යුවලක් මිල දී ගැනීම සඳහා පියා හෝ මව හෝ සමග කතා කිරීම

7.

(i) අ) කලම්බු ජර්නල්

ආ) ලංකාලෝකය

ඇ) ලක්මිණි පහණ

ඈ) ලේක්හවුස් පුවත්පත් ආයතනය

(ii) ඉහළ සිට පහළට සන්නිවේදනය

පහළ සිට ඉහළට සන්නිවේදනය

හරස් සන්නිවේදනය

(iii) තමා පිළිබඳ සත්‍ය තොරතුරු වසන් කරමින් අන් අය රැවටීමෙන් වැළකීම
වැරදි හා අසත්‍ය තොරතුරු ජාලයට එක් කිරීමෙන් වැළකීම
තමන්ගේ පෞද්ගලික තොරතුරු අනවශ්‍ය අය වෙත ලබා දීමෙන් වැළකීම
සමාජ සදාචාරයට හානි නොවන සේ භාවිත කිරීම
අන් අයගේ පෞද්ගලිකත්වයට හානි නොවන සේ භාවිත කිරීම

(iv) වැඩ සටහන් සැලැස්ම හඳුනා ගැනීම හා පෙර සූදානමක් පැවතීම
තමා පිටපත රචනා කරන වැඩසටහන ඉදිරිපත් කරන්නේ කාටද? කුමන වේලාවකට ද? ඉදිරිපත් කරන්නේ මොනවා ද? කුමන කරුණක් සඳහා ද? යන්න පිළිබඳ අවධානය යොමු කිරීම
පිටපත් රචනය සඳහා පෙර සූදානමක් ඇති කර ගැනීම (වැඩසටහනේ පරමාර්ථය, ඉදිරිපත් කරන මාදිලිය හා ඒ සඳහා භාවිත කරන ආකෘතිය, තම ග්‍රාහක කණ්ඩායම, ඉදිරිපත් කරන ගුවන් කාලය, පිළිබඳ සැළකිලිමත් වීම)
භාෂාවේ ස්වරූපය - කථන ව්‍යවහාරයට ලිවිය යුතු බව
ආමන්ත්‍රණ ස්වරූපය - ඒක පුද්ගල ආමන්ත්‍රණ ස්වරූපය හෝ මිත්‍රශීලී ආමන්ත්‍රණ ස්වරූපය
ශ්‍රවණ ස්වරූපය - ඇසෙන්නේ එක් වරක් පමණක් බැවින් මුල් අවස්ථාවේ දීම අසන්නාට තේරුම්ගත හැකි වීම
ශබ්ද ස්වරූපය - ශබ්දය පමණක් යොදා ගන්නා බැවින් සියලු දේ එමගින් මනසේ මැවිය යුතු වීම
පිටපතෙහි තාක්ෂණික උපදෙස් ඇතුළත් කළ යුතු වීම

*****